**SINGALEESI**

# වලංගු වීම සඳහා විදේශිකයන්ට පුවත්

## සංක්‍රමණිකයන් සඳහා වන විශේෂ සේවා මගින් පහත දැක්වෙන දේවල් සඳහා සහය සපයයි:

- ඒකීකරණය කිරීමේ දී මුල් අවධියේදී ඔබට සහය අවශ්‍ය නම්.
- ඔබ නේවාසික බලපත්‍රයක් හෝ ලියාපදිංචි නගර සභාවක් නොමැතිව හෙල්සින්කි හි රැඳී සිටින්නේ නම්.
- ඔබ මිනිස් ජාවාරමේ ගොදුරු සඳහා වන සහය පද්ධතියේ සිටී නම් හෝ ඔබව සූරාකෑමට ලක්ව ඇති බවට සැක කරන්නේ නම්.

ඔබට ඔබගේ නව නේවාසික රටෙහි එදිනෙදා ජීවිතය කළමනාකරණය කිරීමට උපකාර කිරීමට අපි සහය දෙන්නෙමු. එකට එක්වී, මූල්‍ය, නිවාස, යහපැවැත්ම සහ සබඳතා හා සම්බන්ධ ගැටළුවලට විසඳුම් සොයාගන්නට අපිට හැකි වේ. අතිරේකව, පදිංචිය, රටට ඇතුල්වීම සහ සමාජ සහභාගීත්වයට අදාළ කරුණු සම්බන්ධයෙන් සහයවීමට අපිට හැකි වේ. අපි අපගේ සේවාවල දී අවශ්‍ය විටෙක දී පරිවර්තකයන්ව යොදා ගන්නෙමු.

අපි Työpajankatu 14A, 00580 Helsinki හි පිහිටි Kalasatama සෞඛ්‍ය සහ යහපැවැත්ම මධ්‍යස්ථානයේ දී අවශ්‍ය ඕනෑම පුද්ගලයෙකුට සමාජ සුබසාධන ඉදිරි දැක්මකින් වේලාව වෙන් කිරීමකින් තොරව උපදෙස් ලබා දෙන්නෙමු.

## වේලාව වෙන් කිරීමෙන් තොරව මුහුණට මුහුණලා උපදේශනය

ස්ථානය: Kalasatama Health and Well-being Center (THK), Työpajankatu 14A

වේලාව: පෙ.ව. 8:15 - ප.ව. 4:00

කාමරය: 1001, පෝලිම් අංකයක් ලබා ගෙන සේවාව ලද හැකිවේ

## දුරකථනයෙන් උපදේශනය

සංක්‍රමණිකයන් සඳහා සහ මිනිස් ජාවාරමට ගොදුරුවූවන් සඳහා

දුරකථනය: 0931037577

වේලාවන්: පෙ.ව. 8:15 - ප.ව. 12:00 සහ ප.ව. 1:00 - ප.ව. 4:00

ලේඛනගත නොවූ පුද්ගලයන් සඳහා

දුරකථනය: 0931023747

වේලාවන්: පෙ.ව. 9:00 - ප.ව. 4:00

Maisa ඔන්ලයින් සේවාවෙන් ද ඔබට අපගේ සේවා සඳහා අයැදුම් කළ හැකි වේ.

**සංක්‍රමණිකයන් සඳහා වන සේවාවට පහත උදාහරණ ලෙස දක්වා ඇති ඒවා වැනි අවස්ථාවල දී ඔබට සහය විය හැකිවේ:**

- මට නේවාසික පහසුකම් සඳහා අයදුම් කිරීමට හෝ කුලී ගිවිසුමක් අවබෝධ කර ගැනීමට අපහසු බව හැඟෙන අතර සහය අවශ්‍ය වේ.
- මට පවුලේ අය නැවත එකට එක්වීමේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති අතර මගේ පවුල ෆින්ලන්තයට පැමිණෙන විට සහය අවශ්‍ය වේ.
- මවි භාෂාවෙන් ලැබෙන උපදෙස් සහ ද්‍රව්‍ය ප්‍රමාණවත් නොවන නිසා මගේ කාරණා කළමනාකරණය කිරීමට මට තවදුරටත් උදවු අවශ්‍ය වේ.
- මට මූල්‍යමය ගැටළු ඇති අතර මූල්‍යමය සැලසුම්කරණය පිළිබඳ උපදෙස් අවශ්‍ය වේ.
- මට පදිංචිය හෝ රටට ඇතුල්වීම සම්බන්ධ ගැටළුවලට සහය අවශ්‍ය වේ.
- මම ලේඛනගත නොවී ඇති අතර දුෂ්කර ජීවන තත්වයක දී සහය අවශ්‍ය වේ.
- මට මගේ යහපැවැත්ම, මානසික සෞඛ්‍යය, හෝ සම්බන්ධතාවලට අදාළ ගැටළු සඳහා උපකාර අවශ්‍ය වේ.
- මම මිනිස් ජාවාරමේ හෝ වෙනත් සූරාකෑමක ගොදුරක් වී ඇති අතර මා සිටින තත්වයට සහය අවශ්‍ය වේ.
- මම අන්තර්ජාතික ශිෂ්‍යයෙකු වන අතර එදිනෙදා ජීවිතය කළමනාකරණය කිරීමට සහය අවශ්‍ය වේ.